ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

10/02/2026 චක්‍රලේඛන අංක 10/**2026**

සියලුම දිසා කොමසාරිස් වරුන් මගින්,
සියලුම සහය දිසා කොමසාරිස් වරුන් (මානවක) වෙත,

**<u>සහය දිසා කොමසාරිස් (මානවක) සම්මන්ත්‍රණය</u>**
**<u>2026 පෙබරවාරි මස 28 වන සෙනසුරාදා දින පෙ.ව 9.00 ට</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ මානවක බාලදක්ෂ සහය දිසා කොමසාරිස් වරුන් සඳහා පවත්වනු ලබන වර්ෂයේ පළමු සම්මන්ත්‍රණය **<u>2026 පෙබරවාරි මස 28 වන සෙනසුරාදා දින පෙ.ව 9.00 ට</u>** කොළඹ ජාතික බාලදක්ෂ මූලස්ථාන ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.

ඒ සඳහා ඔබ දිසාවේ මානවක බාලදක්ෂ සහය දිසා කොමසාරිස් වරයෙකු/වරියක සහභාගී කරවන මෙන් දන්වා සිටිමු. මානවක සහය දිසා කොමසාරිස් වරයෙක් මෙතෙක් පත් කර නොමැති දිස්ත්‍රික්ක සඳහා දිසාවේ මානවක බාලදක්ෂ අංශය ඉදිරියට ගෙන යා හැකි අයෙකු ඒ සඳහා පත් කොට ඔහු/ඇය මෙම රැස්වීම සඳහා සහභාගී කරවන මෙන් දන්වා සිටිමු. එදින රැස්වීම සඳහා සහභාගී වන සියලුම දෙනා නිල ඇඳුමෙන් පැමිණිය යුතු බව ද දන්වා සිටිමු. මේ සඳහා සහභාගීවන අයගේ නම, තනතුර, දිස්ත්‍රික්කය හා වට්සැප් දුරකථන අංකය
මානවක අංශයේ slscout3@yahoo.com යන ඊමේල් ලිපිනයට පෙබරවාරි 21 වන දිනට පෙර දැනුම්වත් කරන්න.
මානවක බාලදක්ෂ අංශය උසස් මට්ටමින් පවත්වාගෙන යාම සඳහා ඔබ සැමගේ දායකත්වය ගෞරවයෙන් අපේක්ෂා කරමු.

මේ පිළිබඳ ඔබගෙන් ලැබෙන සහය අගය කොට සලකමු.

**ස්තූතියි**
**මෙයට**
**බාලදක්ෂ සේවයේ නියුතු**

***ඊ.කේ. දිලුම් දුමින්ද***
පුහුණු කිරීමේ නායක
සහය ප්‍රධාන කොමසාරිස්(මානවක)

**මනෝජ් නානායක්කාර**
ප්‍රධාන කොමසාරිස්

**පිටපත් -**
ජාතික මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සභාපති, විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk